රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
**Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government**

ඒකාබද්ධ සේවා අංශය | இணைந்த சேவைகள் பிரிவு | **COMBINED SERVICES DIVISION**

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව. | சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. | Independence Square, Colombo 07, Sri Lanka

දුරකතන / தொலைபேசி: **(94) 011- 2694560** / Telephone
ෆැක්ස් / தொலைநகல்: **(94) 011- 2692254** / Fax
ඊ-මේල් / மின்னஞ்சல்: **dgcs@pubad.gov.lk** / E-mail
වෙබ් අඩවිය / இணையத்தளம்: **www.pubad.gov.lk** / Web Site


මගේ අංකය / எனது இல / My No: CS/DOS/Policy/03/05(II)
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2022.06.15

අමාත්‍යාංශ ලේකම්වරුන්

දෙපාර්තමේන්තු ප්‍රධානීන්

දිස්ත්‍රික් ලේකම්වරුන්

ප්‍රාදේශීය ලේකම්වරුන්

**<u>සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය වීමට මනාපය පළ කරන ලද නිලධාරීන්ගේ ආයතනික කටයුතු සම්බන්ධවයි</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් මගේ සමාංක හා 2021.12.16 දිනැති ලිපියට වැඩිමනත් වශයෙනි.

02. එම ලිපියේ 04 ඡේදයෙහි දක්වා ඇති පරිදි සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය වීම සඳහා මනාපය පළ කරන ලද නිලධාරීන් සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය කිරීම සඳහා අවශ්‍ය ලේඛන යොමු කිරීමේ ප්‍රමාදයක් පවතින අතර එයට හේතුවක් ලෙස අන්තර්ග්‍රහණය වීම සඳහා මනාපය පළ කරන ලද නිලධාරීන් අන්තර්ග්‍රහණය කිරීමෙන් පසු වෙනත් සේවා ස්ථාන වෙත ස්ථාන මාරු නියෝග නිකුත් කරන බවට නිලධාරීන් තුළ ආකල්පයක් පවතින බව නිරීක්ෂණය වී ඇත.

03. ඒකාබද්ධ සේවයේ සංවර්ධන නිලධාරී සේවයට අයත් නිලධාරීන් ස්ථාන මාරුවලට යටත්වන නමුදු සේවා අවශ්‍යතාවය මත හෝ විනය හේතු මත ස්ථාන මාරු කිරීමක දී හැර යම් නිලධාරියෙකුහට ස්ථාන මාරු නියෝග නිකුත් කරනු ලැබෙනුයේ අදාළ නිලධාරියාගේ ඉල්ලීම් ලිපිය හා නිලධාරියා සේවය කරනු ලබන ආයතනයේ ආයතන ප්‍රධානියාගේ නිර්දේශයක් සහිතව ලිපි ඉදිරිපත් කිරීමෙන් පසුවය. තවද යම් නිලධාරියෙකුහට වාර්ෂික ස්ථාන මාරු නියෝග නිකුත් කරනු ලැබෙනුයේ වාර්ෂික ස්ථාන මාරු පටිපාටියට අනුකූලව පමණක් වේ.

04. ඒකාබද්ධ සේවයේ සංවර්ධන නිලධාරී සේවයට අයත් පමණින් ස්ථාන මාරුවලට යටත් වන නමුදු එම නිසා සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය වීම සඳහා මනාපය පළ කරන ලද නිලධාරීන් සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය වූ පමණින් ස්ථානමාරු ලබාදීමක් සිදු නොවන බව දන්වන අතර මෙම අන්තර්ග්‍රහණ කටයුතු කඩිනමින් අවසන් කිරීම සඳහා සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය වීමට මනාපය පළ කරනු ලැබ මෙතෙක් අන්තර්ග්‍රහණ ලිපිය නිකුත් කර නොමැති ඔබ අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/කාර්යාලයේ සේවයේ නියුතු නිලධාරීන් සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය සඳහා අවශ්‍ය ලේඛන නොපමාව මා වෙත යොමු කරන මෙන් කාරුණිකව ඔබ වෙත දන්වමි.

05. තවද සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය වීම සඳහා මනාපය පළ කරන ලද නිලධාරීන් සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය කිරීමේ කටයුතු සිදු කිරීමේදී අවශ්‍ය ලිපි ලේඛනවල අඩුපාඩු සෑම සතියකම සඳුදා දින මෙම අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ පළ කරනු ලබන අතර වෙබ් අඩවියේ පළ කර ඇති අඩුපාඩු ලේඛන කඩිනමින් මා වෙත යොමු කිරීමට කටයුතු කරන ලෙස ද කාරුණිකව දන්වමි.

06. තවද මගේ අංක CS/DOS/Policy/පොදු/01 හා 2021.10.25 දිනැති ලිපියෙන් සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා ප්‍රාදේශීය ලේකම්වරු දැනුවත් කරමින් නිකුත් කරන ලද ලිපිය අනුව සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය සඳහා ඉදිරිපත්ව ඇති සහ වසර තුනක කාලයකට වැඩි අක්‍රියව ඇති ලිපිගොනු සම්බන්ධ වාර්තාවක් මෙම අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ සෑම සති දෙකකටවරක් පළ කරනු ලබන අතර එකී ලිපියේ උපදෙස් අනුව අදාළ ලේඛන/තොරතුරු මා වෙත එවීමට කටයුතු කරන ලෙස ද වැඩිදුරටත් දන්වමි.

එස්. ආලෝකබණ්ඩාර
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්